

# කොඩියගෙ ළම

ලක්ෂමන් කොඩිතුවක්කු

## ගුටයාරස් සහ මං

ගුටයාරස් මහල්ලෙකි. ඔහුගේ වකුගඩු ද්විත්වයම අක්‍රිය වී ඇති බැවින් සතියකට දින තුනක්, පැය පහක් බැගින් රුධිරය පාරවිලනය කරගන්නට අවශ්‍ය රෝගියෙකි. වයසත් සමඟ වකුගඩු බද්ධ කිරීමට නොහැකි බැවින් ඔහුට මැරෙන තුරාවටම එසේ ලේ පිරිසිදු කර ගැනීමට රෝහලට යාමට ඒමට සිදුවේ. සමහර දින වලදී ගිලන් රථ නිලධාරියෙකු වශයෙන් මා ඔහුව රෝහල කරා රැගෙන යන අවස්ථා ඇත. දිනක් එසේ හමු වූ දිනකදී ඔහු ඔහුගේ අත්ල හකුළුවා මට පෙන්වා කිව්වේ වකුගඩු වල



තරම නොහොත් ප්‍රමාණයයි.

"අපේ වකුගඩු දෙක මේ තරම් පොඩියි යාළුවා. ඒක මටත් වඩා උඹ හොඳට දන්නවා. ඒ වුණාට මේ පුංචි වකුගඩු අපේ ශරීරයට කරන සේවය කෙතරම්ද කියලා මට දැනුණෙ ඔය ඩයලයිසස් කරන ලොකු මැෂිම දැක්කමයි. පැය පහක් හයක් මගේ ඇඟේ ලේ ඔය මැෂිමට යවලා පිරිසිදු කරලා ආපහු මගේ ඇඟට ඇතුල් කලේ නැත්නම් මං මැරෙනවා. තරුණ කාලේ මත්පැන් සිගරට් බිව්ව මං අද ඒ වෙනකොට හිතන්නේ ඒ මැෂිම මට කරන සේවය ගැන. ඒත් වකුගඩු දෙක ගැන අපි ඒ කාලේ එහෙම හිතුවද?" ඔහු සිනාසෙයි.
ගුටයාරස් උරුගුවේ ජාතිකයෙකි. මීට වසර හතලිහකට පමණ පෙර ඕස්ට්‍රේලියාවට නැවකින් සංක්‍රමණය වූවෙකි. ඔහුගේ ඉංග්‍රීසි බසේ උච්චාරණය බොහෝ දුරට ස්පාඤ්ඤ භාෂාවේ සිරිය උසුලයි. දිනක් අපි ඔහුව රෝහලට රැගෙන යාමට ගිලන් රථය රැගෙන ඔහු වෙසෙන කුඩා නිවසට ඇතුලු වුනෙමු. රෝද පුටුවක් ආධාරයෙන් එම කුඩා කාමරයේ එහා මෙහා යන ඔහු තමන්ගේ වැඩ කටයුතු තනිවම කරගැනීමට දරන උත්සාහය බොහෝවිට අපි දැක ඇත්තෙමු. හැම දෙයක්ම ඇත්තේ අතේ දුරින්ය. සතියකට පැය කිහිපයක් හෙද සහයකයෙකුගේ සහාය ලබා ගන්නා ගුටයාරස් ඔහුට අවශ්‍ය සරල කෑම වේල ඔහුම පිළියෙල කර ගනියි. ඒ කාමරයේ තිබූ චිත්‍ර පින්තාරු උපකරණ නිසා ඔහු චිත්‍ර ශිල්පියෙකු වන්නට ඇතැයි මම අනුමාන කළෙමි. එසේම එම කුඩා කාමරයේ චේගුවේරාගේ රූපය සහිත විශාල පින්තූරයක්ද බිත්තියේ එල්ලා ඇත. පසෙකින් ඔහුටම හිමි පොත් රාක්කයක් ඇත. එය ඇත්තේ ඔහුගේ සයනයට යාවය. සයනයේ සිටම ඔහුට අවැසි පොත් තෝරාගෙන කියවිය හැක. ස්පාඤ්ඤ බසින් ලිය වී ඇති එහි බොහෝ පොත් පත් අතර චේගුවේරා හා බොලීවියානු විප්ලවය, සෝවියට් දේශයේ පෙරළිය සම්බන්ධ පොත් පත් ද තිබෙන අන්දම මම දුටුවේ එම පොත් වල පිටක වරයන් නිසාය. වසර තිහක් පමණ පැරණි චේගුවේරා ගැන ලියවුණු පොතක් ඔහු මා අත තබා කියවා නැවත බාර දෙන ලෙස පැවසූ අන්දම මට සිහිවේ.

"මට ස්පාඤ්ඤ භාෂාව බැහැ ගුටයාරස්"

"ආ ඒක මට අමතක උනා. උඹ දන්නවද යාළුවා මං චේගුවේරව දැකල තියෙනවා. කතා කරලත් තියෙනවා. මං ඒ කාලේ චේගුවේරාගෙ අදහස් වලට සහය දක්වපු තරුණයෙක්. ඔහුගේ විප්ලවීය වෙනසට, අදහස් වලට උන්මාදයෙන් හිටපු කාලයක් මටත් තිබ්බා. මං ආජන්ටිනාවේ කල සංචාරයක දී චේගුවේරා මුණ ගැහිලා කතා කරලත් තියෙනවා. මං තවමත් විප්ලවයටත් වඩා ඒ පුද්ගලයාට ගරු කරනවා."

බිරිඳ මිය ගිය පසු තනිවම ජීවත්වන ගුටයාරස් ජීවිතයේ අල්පේච්ඡතාවය ගැන බොහෝ දුරට සිතනා සාමකාමී පුද්ගලයකි. ඔහු කාන්සිය පාලුව මකා ගැනීමට චිත්‍ර ශිල්පයට හුරු වී සිටියි.

"ඔය චේගුවේරාගේ රූපේ තවත් රූපයක් බලාගෙන මං ඇඳපු එකක්" එහු ඒ දෙස බලා අවිහිංසකව සිනාසෙයි. ශ්‍රවණාබාධයකින් ද පෙළෙන ගුටයාරස්ට තරමක් උස් හඬින් ආමන්ත්‍රණය කිරීමට සිදුවන අවස්ථාද ඇත.

දිනක් අප ඔහු රෝහලට රැගෙන යාමට නිවසට යන විට, ඔහු චිත්‍රයක් අඳින අයුරු මම දුටුවෙමි. මම ඔහුගේ සවනට ළං වී ආමන්ත්‍රණය කරන තුරු ඔහුට ඒ බවක් නොදැනුණේය.
"ගුටයාරස් අද ඩයලයිසිස් යන්නේ නැද්ද?" මම ඇසුවෙමි.
"මට පැය භාගයක් දීපන් මිත්‍රයා මේක ඉවර කරන්න" ඔහු කීවේය.
"ගුටයාරස් ඔය චිත්‍ර විකුණනවාද?"
"නැහැ නිකමට අඳිනවා. අර තියෙන්නේ ඇඳපුවා. උඹට ඕන්නම් එකක් දෙකක් අරගෙන පලයන්" ඔහු ඇඳපු චිත්‍ර මට පෙන්වයි. සියල්ල සොබා දහම පරිසරය වර්ණවත් කළ චිත්‍රයන්ය. ඒ චිත්‍ර බොහෝ දුරට උරුගුවේ පරිසරයට සමාන එහි සොබා සිරිය උසුලන චිත්‍ර බව මට පසක් විය.
"ගුටයාරස් අද අඳින්නේ ගැහැනියකගෙ චිත්‍රයක් නේද?"
අඩක් විළිවසා ගත් ගැහැනියකගේ රූපයක් ඔහු ඉදිරිපස ඇති කැන්වසය තුළින් මට පෙනෙයි.
"විප්ලවය අවශ්‍ය කාලේ අපි විප්ලවය කලා යාළුවා. ඒත් දැන් මට හිතෙනවා විප්ලවවලින් රටවල් වෙනස් කරන්න බැහැ කියලා. ඕස්ට්‍රේලියාවේ ජීවත් වෙනකොට ඒක හුඟක් දැනෙනවා. අද තියෙන්නේ වෙනස්ම ලෝකයක්. මං දැන් ආදරය කරන්නේ පරිසරයට සොබාදහමට "
ඔහුගේ තෙළිතුඩින් නිමවුණු මුහුදු වෙරළක්, කඳු වළල්ලක් , මල් යායක් මගේ දෑස් හා ගැටෙයි.
"චේගුවේරා එඩිතර විප්ලවාදී නායකයෙක්. ලෝකෙට වෙනසක් අවශ්‍ය කාලෙක ඔහු ඒක කරන්න හැදුවා. ඒත් අද ඒ වෙනස මේ ලෝකෙට ගැලපෙන්න නෑ යාළුවා." ඔහු සන්සුන්ව සිනාසෙයි.
"ගුටයාරස්ගේ රටේ ඒ කියන්නේ උරුගුවේ ජනාධිපතිල අවංක නායකයො කියලා මං අහලා තියෙනවා. ඔවුන් නිහතමානී, දූෂිත නැති සරල පුද්ගලයෝ එහෙම කියලා"
"ඔව් අපේ රටේ හුඟක් හොඳ දේශපාලනඥයෝ ඉන්නවා. ටබාරි හොඳ නායකයෙක්. ඊටත් වඩා මං අගයන්නේ ජෝසි මුජිකව ඔහු අවංකවම ජනතා සේවයට කැපවුණු කෙනෙක්. උඹ මොන රටෙන්ද?"
ඔහු අවසානයේ මගෙන් එසේ ඇසුවේය. ඔහු මගේ උපන් රට පිළිබඳව විමසුවේ එදාමය.
"ශ්‍රී ලංකාවේ"
"ඕ..... ට්‍රී කන්ට්‍රි. මං අහලා තියෙනවා. යුද්ධයක් තිබ්බ නේද ? ඒක ඉවරද දැන්"
"ඉවරයි" මං එසේ කියා සිනාසුනෙමි.
"මොනා උනත් මං උරුගුවේ දේශපාලනඥයෝ ගැන ආඩම්බර වෙනවා. උඹලගේ රටේත් අපේ රටේ වගේම හොඳ දේශපාලනඥයෝ ඇති නේද?"
මීට ඉහතදී අත්ල හකුලුවා ඔහු පෙන්වූ වකුගඩුව හා විශාල රුධිර පෙරණ යන්ත්‍රය මට සිහිවිය. ඒ මතකයෙන්ම ඔහුගේ ප්‍රශ්නයට මට නිහඬව සිනාසුනෙමි.



සන්නස SANNASA CARTOON By PK

